# අභිලාෂය ප්‍රකාශ කිරීමේ කැඳවීම

# දැන්වීම

## ආයතනය: කැස්බෑව නගර සභාව

**ව්‍යාපෘතිය :** පොදු මහජනතාවගේ සහ සංචාරකයන්ගේ විනෝදාස්වාද අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම සඳහා කැස්බෑව වැව ආශ්‍රිතව හංස බෝට්ටු ව්‍යාපෘතියක් ආරම්භ කර පවත්වාගෙන යාම

1. ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් අභිලාෂය ප්‍රකාශ කිරීමේ අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.
2. අයදුම්කරුවන් සපුරා තිබිය යුතු මූලික සුදුසුකම්:
   - අයදුම්කරු විසින් පසුගිය වසර දහය (10) තුළ හංස බෝට්ටු හෝ ඊට සමාන ජල විනෝදාස්වාද ව්‍යාපෘති අවම වශයෙන් එකක් (01) සාර්ථකව ක්‍රියාත්මක කර ඇති බවට ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.
   - අයදුම්කරුගේ ආයතනයේ පූර්ණකාලීනව සේවය කරන, පිළිගත් සුදුසුකම් සහිත ජීවිතාරක්ෂක (Lifeguard) නිලධාරියෙකු අවම වශයෙන් එක් අයෙකු (01) සිටිය යුතු අතර, ඒ සඳහා අදාළ සහතික ඉදිරිපත් කළ යුතුය.
   - ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවම වශයෙන් හංස බෝට්ටු තුනක් (03), ප්‍රමාණවත් ජීවිතාරක්ෂක ජැකට් (Life Jackets) සහ අනෙකුත් අවශ්‍ය ආරක්ෂක උපකරණ සැපයීමට හැකියාව අයදුම්කරු සතුවිය යුතුය.
   - අයදුම්කරු නීත්‍යානුකූලව ලියාපදිංචි ආයතනයක් හෝ ව්‍යාපාරයක් විය යුතු අතර, අදාළ ලියාපදිංචි සහතික ඉදිරිපත් කළ යුතුය.
   - ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික හැකියාව ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.
   - සියලුම අදාළ ආරක්ෂක නීති, පාරිසරික නියමයන් සහ රාජ්‍ය ආයතන විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ පිළිපැදීමට අයදුම්කරු එකඟ විය යුතුය.
3. උනන්දුවක් දක්වන ආයතන විසින් තමන්ගේ (අ) ආයතන ලියාපදිංචි සහතික, (ආ) පූර්ව ව්‍යාපෘති පළපුරුද්ද තහවුරු කරන ලේඛන, සහ (ඇ) ප්‍රධාන කාර්ය මණ්ඩලයේ ජීව දත්ත පත්‍රිකා (CVs) ඇතුළත් ඔබ විසින් සකස් කරන ලද විධිමත් අභිලාෂය ප්‍රකාශ කිරීමේ යෝජනාව පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය.
4. අයදුම්පත් 2026 සැප්තැම්බර් 04 වන දින පස්වරු 2.00 ට පෙර **"කැස්බෑව නගර සභාව, පිළියන්දල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ අතින් ගෙනැවිත් ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය.
5. අයදුම්පත් පරීක්ෂා කර බලා මූලික සුදුසුකම් ලබන ආයතන පමණක් කෙටි ලැයිස්තුවකට ඇතුළත් කරන අතර, ඔවුන් වෙත පමණක් ඉදිරියේදී මිල යෝජනා කැඳවීමේ ලේඛන නිකුත් කරනු ලැබේ.

**සභාපති,**